# ගොවිතැනෙන් බැහැර රැකියා අවස්ථා

**ගම්බද තරුණ තරුණියන්ට මූලික වශයෙන් රැකියා සැපයෙන්නේ කෘෂිකර්මයෙන් පමණක්යැයි විශ්වාසයක් පවතී. එය බැලූ බැල්මට සත්‍යයක් ලෙස පෙනී යන කරුණකි.**

**එහෙත් ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකර්මයෙන් බැහැර රැකියා අවස්ථා ප්‍රමාණය කොතෙක්ද? ඒ පිළිබඳව මෙම ලිපියෙන් විමර්ශණයක් කෙරේ.**

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි

**ආර්. බී. සේනක ආරච්චි**

— විසිනි —

1980/81 දී පවත්වන ලද ශ්‍රම බලකාය හා සමාජ ආර්ථික සමීක්ෂණ තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ශ්‍රම හමුදව 5,594,481 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මින් සේවා නියුක්ත ප්‍රමාණය 84.7% කි. ඇස්තමේන්තු කරන ලද ශ්‍රම හමුදවෙන් 8 % ක්ම ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වෙති. එමෙන්ම ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ශ්‍රම හමුදවෙන් 44% ක්ම වයස අවුරුදු 10 - 29 ත් අතර වන තරුණ ශ්‍රමය වීම විශේෂ ලක්ෂණයකි. එමෙන්ම මුළු ශ්‍රම බලකායෙන් 68% කට වැඩි පිරිසක් වෘත්තිමය කාර්ය භාරයක් ඇරඹීම සඳහා අවශ්‍ය තරමේ ප්‍රථමික හෝ ද්විතිය අධ්‍යයනයක් ලබා ඇත.

ග්‍රාමීය ශ්‍රම හමුදව නියලී සිටින රැකියා පිළිබඳව සැලකීමේදී 50% කට ආසන්න ප්‍රමාණයක් කෘෂි කර්මාන්තයට ආශ්‍රිත රැකියාවල නියැලී සිටින බැව් දැකිය හැක. මුළු ශ්‍රාම හමුදවෙන් 25% ක් නියුක්තව සිටිනුයේ නිෂ්පාදන අංශ සම්බන්ධ රැකියාව වලය. අලෙවි අංශය හා සේවා අංශය හා සම්බන්ධිත ශ්‍රමිකයන්ගේ ප්‍රතිශතය පිළිවෙලින් 7.5% සහ 5 4% වශයෙන් දැක්වේ.

ග්‍රාමීය අංශයේ රැකියා අවස්ථා පිළිබඳව සැලකීමේදී කෘෂිකාර්මික අංශයේ එනම් බෝග වගාව පශු සත්වය පාලනය සහ මසුන් ඇල්ලීමේ කටයුතු වල පූර්ණ කාලීනව හෝ අර්ධ කාලීනව නියැලී සිටී. සංඛ්‍යාත්මක වශයෙන් කෘෂි නොවන කටයුතු වල යෙදී සිටින ග්‍රාමීය ශ්‍රමය මුළු ශ්‍රම බලයෙන් 39% ක් පමණ වේ. සම්ප්‍රදායික ග්‍රාමීය කෘෂි අංශයේ වැදගත්ම ශිල්පීන් ලෙස වඩුවන්, පෙදරේරුවන්, කම්මල් කරුවන් ගොවි උපකරණ සහ මෙවලම් අලුත් වැඩියා කරන්නන් සහ කෘෂි බෝග පදනම් කොටගත් කර්මාන්ත වල නියැලී සිටින්නන් දැක්විය හැකිය. ග්‍රාමීය කෘෂි නොවන රැකියා ප්‍රධාන වශයෙන් ගෘහ කර්මාන්ත හා වෙනත් පාරම්පරික කර්මාන්ත පදනම් කොට බිහිවී ඇත. පාරම්පරික කැටයම් කර්මාන්ත පදනම් කොට බිහිවී ඇත. පාරම්පරික කැටයම් කර්මාන්තය, ලෝහ ආශ්‍රිත කර්මාන්ත වලං සහ මැටි ආශ්‍රිත කලාත්මක භාණ්ඩ නිෂ්පාදන හා සෙල්ලම් බඩු නිෂ්පාදනය බතික් නිෂ්පාදන හා කෙඳි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත මේ යටතට ගැනේ. මේවා ග්‍රාමීය ප්‍රදේශවල ස්ථානගතව ඇතිවාක් මෙන්ම ඒ ඒ නිෂ්පාදන ගැන ප්‍රාදේශික වශයෙන් ප්‍රසිද්ධියක් ලබා ඇත. උදාහරණ වශයෙන් රන්, රිදී, තඹ, පිත්තල කර්මාන්තය මෙන්ම ලී කැටයම් පිළිබඳවද මහනුවර දිස්ත්‍රික්කය ප්‍රසිද්ධියක් උසුලයි.

ඇතැම් සේවාවන් පදනම්කොට බිහිවූ ග්‍රාමීය රැකියාවන් රාශියක්ද දැකිය හැක. මේවා බොහෝ විට සම්ප්‍රදායික කුල ක්‍රමය පදනම් කොට ගෙන බිහිවූ ඒවාය. බෙරවයන්නන්, රෙදි සෝදන්නන්, කරනවැමියන්, වලං තනන්නන්, නක්ෂත්‍ර කරුවන් වැනි සේවාවන් ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශ වලින් ක්‍රමයෙන් අහෝසි වී යමේ පෙර ලකුණු දැකිය හැක.

බොහෝ ගෘහ කර්මාන්ත මෙන් පාරම්පරික කර්මාන්ත වල විශේෂ ලක්ෂණය වනුයේ සම්ප්‍රදායික කලාවන් තාක්ෂණය මෙන්ම දේශීය අමුද්‍රව්‍ය යොදා පවුල් ශ්‍රමය මගින් අඩු ප්‍රාග්ධන ආයෝජනයක් සහිතව කුඩා පරිමාණයෙන් භාණ්ඩ නිෂ්පාදනය කිරීමයි. ලෝහ ආශ්‍රිත කර්මාන්ත ලෙස ප්‍රධාන වනුයේ රන්, රිදී, ආභරණ තැනීම්, පිත්තල කර්මාන්ත වැනි ඒවාය. රන් රිදී කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශයන්හි පිරිමි ශ්‍රමය සඳහා බොහෝ විට සීමාවී ඇති අතර. ශිල්පය දැනුම පරම්පරාවෙන් පරම්පරාවට දයාද කොට දෙන ලද්දකි. ලී පදනම් කොටගත් කර්මාන්තයන් අතර ප්‍රධාන වනුයේ වෙස් මුහුණු කැපීම හා ලී කැටයම් කලාවයි. සංචාරක ව්‍යාපාරය විධිමත් වීමත් සමග මෙම අංශයේ ඇතිවූ රැකියා අවස්ථා අතිවිශාලය. වලං තැනීම වුවද, සුළු පිරිසකට සීමා වූ කුලය පදනම් කොට ගත් සම්ප්‍රදායික රැකියාවක් විය. නිෂ්පාදන භාණ්ඩ බොහෝ විට සීමා වී තිබුණේ මුළුතැන්ගෙයි සඳහා අවශ්‍ය උපකරණ රැසක් නිර්මානය කිරීම සඳහා පමණි. එහෙත් මෑත යුගයේ මැටි ආශ්‍රිතව බිහිවූ මල් පෝච්චි විසිතුරු භාණ්ඩ නිෂ්පාදන සඳහා පුළුල් වෙළඳ පොළක් බිහිව ඇත. රන් රිදී ආභරණ කර්මාන්තය මෙන් නොව ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අතිවිශාල පිරිසක් සඳහා ග්‍රාමීය රැකියා අවස්ථා රාශියක් මේ මගින් සැපයී ඇත.

ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදන දිස්ත්‍රික්කයන්හි කාර්මික නිෂ්පාදන බොහෝමයක් පොල් නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව බිහිව ඇත. පොල් කෙදි ලබා ගැනීම, ලුණු ඇඹරීම පොල් කටු අඟුරු නිෂ්පාදනයා පොල් ඉරටු හා කෙදි මගින් ඉදල් සහ කොසු නිපදවීම, පොල් රා සහ හකුරු තැනීම මෙන්ම කොප්පරා පොල් තෙල් සිඳීම ආශ්‍රිත කර්මාන්තද මේ අතර වැදගත් වේ. මෑත යුගසේ පොල් රා මැදීම වැනී රැකියාවන් පවා ඉතා ඉහල ආදයම් උපයන රැකියාවන් බවට පත්ව ඇත. මේ අනුව පොල් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්තයන්හි ග්‍රාමීය රැකියා අවස්ථා අධික වී ඇත. බතික් නිෂ්පාදනය වැනි ග්‍රාමීය කර්මාන්තයන් පවා ආදයම් ඉපයුම් අතින් මෑත යුගයේදී වැඩි ප්‍රසිද්ධියක් ලබා ඇත. බතික් මුද්‍රිත රෙදිපිලි සඳහා



ගම්බද ආර්ථික කටයුතුවල නියැලෙන තරුණ පිරිසක්

දේශීය හා විදේශීය වෙළඳ පලවලින් විශාල වශයෙන් ඇණවුම් ලැබීම බතික් කර්මාන්තය ග්‍රාමීය රැකියා අවස්ථා බිහිකරලීමට මූලිකව ඇත. බතික් මුද්‍රණය සඳහා පුහුණු ශ්‍රමික දායකත්වය ඉතා වැදගත් වන අතර රැකියා අවස්ථා ස්ත්‍රී පක්ෂය සඳහා බොහෝ දුරට සීමිත වේ. මෙම කර්මාන්තයේ නියැලී සිටින බහුතරය වයස අවුරුදු 15 - 30 ත් අතර වන තරුණියන්ය,

කැස්බැලෙලි වලින් තැනෙන විසිතුරු භාණ්ඩ සඳහාද, වේවැල් වලින් වියන ලද විසිතුරු භාණ්ඩ හා ගෘහ භාණ්ඩද, තල්කොල, පන්, ඉරටු වැනි දේශීය අමුද්‍රව්‍ය වලින් නිමවෙන විසිතුරු භාණ්ඩ සඳහා දේශීය හා විදේශීය වශයෙන් වෙළඳ පොළ විවෘතව පැවතීම ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය සඳහාම ග්‍රාමීය රැකියා අවස්ථා බිහිකිරීමෙ ලා හේතු වී ඇත.

වඩු කාර්මික නිෂ්පාදන ප්‍රධාන වශයෙන් කොටස් හතරකට බෙදිය හැක. (i) ගෘහ උපකරණ නිපදවීම - ගෘහ භාණ්ඩ, මුළු තැන්ගෙයි උපකරණ මේ අතර ප්‍රධාන වේ. (ii) කෘෂි කාර්මික උපකාරක ලී නගුල් හා වෙනත් උපකරණ (iii) ගොඩනැගිලි සඳහා අවශ්‍ය උපකරන - පරාල, දොර ජනෙල් රාමු ආදිය (iv) විවිධ නිෂ්පාදන, ඇසුරුම් පෙට්ටි විවිධ වර්ගයේ කරත්ත, ලී පාලම් ආදිය මෑතකදී රජය විසින් අරඹන ලද නිවාස සංවර්ධන ව්‍යාපාරය, සහ ඉදිකිරීම මෙන්ම පෞද්ගලික අංශයේ ඉදි කිරීම හා රජයේ විශාල වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි ආයෝජන වලදී ග්‍රාමීය වඩු කර්මාන්තයේ නියැලී සිටින විශාල පිරිසකට රැකියා අවස්ථා බිහිවී ඇත. නාගරිකයන්ව මෙන්ම විදේශීය රැකියා ඉඩ ප්‍රස්ථා බිහිවීම නිසා වඩු කාර්මිකයන්ගේ පමණක් නොව පෙදරේරුවන්ගේද ඉපයුම් පසුගිය වසර වල ඉහල යාමට හේතු වී ඇත.

ගෘහ කර්මාන්ත හා පාරම්පරික කර්මාන්ත වල සංවර්ධන කටයුතු විධිමත් කිරීම රජය විසින් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව පිහිටුවා ඇති අතර එම කටයුතු 1978 වර්ෂයේ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවීමත් සමග ඒ යටතට ගෙන එන ලදී. ග්‍රාමීය කර්මාන්ත සඳහා වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීම ග්‍රාමීය කෘෂි නොවන රැකියා සම්බන්ධව ගනු ලැබූ තවත් එක් පියවරකි. ගෘහ කර්මාන්ත හා පාරම්පරික කර්මාන්ත නිෂ්පාදන අලෙවිය අපනයන වැඩි දියුණු කිරීම මෙම අමාත්‍යාංශය පිහිටුවීමේ පුළුල් අරමුණ වී ඇත. 1977 න් පසු රජයේ නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය මෙන් කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය, ආයෝජන සංවර්ධන කලාපය, දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම, ග්‍රාමීය නිවාස හා නගර සංවර්ධන යෝජනා ක්‍රම යටතේ කෘෂිකාර්මික අංශයේ මෙන්ම කෘෂිකාර්මික නොවන අංශයන්හි විශාල පිරිසකට සේවා නියුක්ත ඉඩ ප්‍රස්ථා බිහිවී ඇත. එසේම රජය විසින් ග්‍රාමීය තරුණ තරුණියන් වෘත්තිමය පුහුණුවක් ලබා දීමේ අරමුණින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන රැසක් අරඹා ඇත. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා මෙන්ම පෞද්ගලික ආයතනද කෙටිකාලීන මෙන්ම දිගු කාලීන විධිමත් හා අවිධිමත් පුහුණු වැඩසටහන් රැසක් ග්‍රාමීය තරුණ තරුණියන් සඳහා අරඹා ඇත. සංඛ්‍යා ලේඛන අනුව රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථා 19 ක් මගින් වෘත්තීය පුහුණු වැඩ සටහන් යටතේ තරුණ තරුණියන් 28310 ක් 1980 වර්ෂය අලදී පුහුණු කොට ඇත. ඊට අමතරව රජයේ නොව සංවිධාන 302 ක්ට ආසන්න සංඛ්‍යාක් ග්‍රාමීය ප්‍රදේශයන්හි සංවර්ධිත කටයුතු වල නියැලී සිටී. මොවුන් විසින් ග්‍රාමීය තරුණ පිරිස් කෙටි කාලීන හා දිගු කාලීන පුහුණු පාඨමාලා මගින් මූලික වශයෙන් සම්ප්‍රදායික ගෘහ කර්මාන්ත, පාරම්පරික කෑටයම් කර්මාන්ත අත්යන්ත්‍ර රෙදි වියම බතික්

මුද්‍රණ ශිල්පීය ඇඳුම් සැකසීම, තඹ පිත්තල හා ලාක්ෂා කර්මාන්ත සහ විවිධ යන්ත්‍ර සූත්‍ර මෙහෙය වීම පිළිබඳ අවශ්‍ය කාර්මික ඥානය ක්‍රමවත්ව ග්‍රාමීය තරුණ පිරිස් වලට ලබා දීමට උත්සාහ දරා ඇත.

ග්‍රාමීය කර්මාන්ත වර්ධනය උදෙසා රජයෙන් ගෙන ඇති ඇතැම් ප්‍රතිපත්ති අනාගතයේදී ග්‍රාමීය රැකියා ව්‍යුහය වෙනස් කරලීමට ප්‍රමාණවත් හේතු විය හැක. මේ අතර පැරණි සම්ප්‍රදායික උපකරණ වෙනුවට තාක්ෂණික අතින් උසස් යන්ත්‍ර උපකරණ විවෘත ප්‍රතිපත්තිය යටතේ ආනයන පහසුව සහනදායි තීරු බදු, නව හා පවත්නා කර්මාන්ත සඳහා අඩු පොලී අනුපාතයන් යටතේ ණය පහසුකම් ලබාදීම දැක්විය හැක. ජාතික සංවර්ධන බැංකුව යටතේ කුඩා පරිමාන කර්මාන්තකරුවන්ට 18% වාර්ෂික පොලියකට රුපියල් දස ලක්ෂ 2 දක්වා කරම් ණය මුදල් ලබාගත හැකි අතර ණය ආපසු ගෙවීම මාස 6 ක සහන කාලසීමාවකට යටත් වේ. ග්‍රාමීය සුළු කර්මාන්ත ඇරඹීමේදී සංවර්ධන මණ්ඩලය මගින් අවශ්‍ය තාක්ෂණික ඥානය හා උපදෙස් ලබා දීමට බැඳී ඇත. අපනයන සංවර්ධන මණ්ඩලය මගින් දේශීය නිෂ්පාදකයින්ට විදේශීය වෙළඳ පොල විවෘත කරදීම ග්‍රාමීය අංශයේ කෘෂි නොවන රැකියා පුළුල් කරලීම මෙන්ම කර්මාන්ත ඇරඹීම සඳහා ව්‍යවසායකයින් දිරිගැන්වෙන රජයේ ඇතැම් ප්‍රතිපත්ති ලෙස හඳුන්වා දිය හැක.



ගම්බද තරුණ තරුණියන්ටද මෙබඳු රැකියා අවස්ථා දුලබ නොවේ